# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,446 - 2025 ජූලි මස 18 වැනි සිකුරාදා - 2025.07.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 150 |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 153 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජූලි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,<br>
කොළඹ 08,<br>
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**<br>
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


149 - B 082701 — 177 (2025/07)<br>
C 1 -

# පිස්කල් විකිණීම්

**ගම්පහ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

ජයසූරිය ආරච්චිගේ පේදිරික් පෙරේරා,
අංක 80/22, බටලන්ද පාර,
මාකොල දකුණ,
මාකොළ.

*............පෙත්සම්කරු (මියගොස්).*

ජයකොඩි ආරච්චිගේ දෝන විනිෆ්‍රීඩා,
අංක 80/22, බටලන්ද පාර,
මාකොල දකුණ,
මාකොළ.

*............ආදේශිත පෙත්සම්කාරිය.*

නඩු අංකය : 5026/M
ස්වභාවය : මුදල්
වටිනාකම : රු. 8,387,500/-
ඇස්කිසි අංකය : 188/25

*එදිරිව*

වාහලතන්ත්‍රිගේ දොන් චන්ද්‍රදාස පෙරේරා,
අංක 566, රන්මුතුගල,
කඩවත.

*...........වගඋත්තරකරු (මියගොස්).*

1. වාහලතන්ත්‍රිගේ දොන් හර්ෂ ඩිලන්ත පෙරේරා,
2. වාහලතන්ත්‍රිගේ දොන් මධුෂාන් ප්‍රසන්න පෙරේරා

*දෙදෙනාම :*

අංක 566, රන්මුතුගල,
කඩවත.

*..........ආදේශිත වගඋත්තරකරුවන්.*

වර්ෂ 2024ක් වූ සැපැතැම්බර් මස 25 වැනි දින දරන අධිකරණයේ සමථය සහ ඊට අදාළ සමථ තීන්දු ප්‍රකාශය අනුව එකී ආදේශිත වගඋත්තරකරුවන් විසින් එකී ආදේශිත පෙත්සම්කාරිය වෙත ගෙවිය යුතු රුපියල් දෙසිය විසිහය ලක්ෂ හතළිස් හය දහසක (රු. 22,646,000/-) සම්පූර්ණ මුදල මේ වන තෙක් එකී ආදේශිත වගඋත්තරකරුවන් විසින් එකී ආදේශිත පෙත්සම්කාරිය වෙත ගෙවීම පැහැර හැර ඇති බැවින් එකී මුදල එකී ආදේශිත පෙත්සම්කාරිය වෙත ගෙවීම සඳහා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ තහනම් කිරීමෙන් හා අවශ්‍ය වුවහොත් විකිණීමෙන් ලබාගත යුතු බවට දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට ආදේශිත වගඋත්තරකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් 01 වන සහ 02 ආදේශිත වගඋත්තරකරුවන්ට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2025 ක් වූ 08 වැනි මස 06 වැනි දින පෙ. ව. 10.00 ට,**

ඉහත නම් සඳහන් 01 සහ දෙවන ආදේශිත වගඋත්තරකරුවන්ට අයත් උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාව තුළ, මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, රන්මුතුගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රන්මුතුගල පිහිටි "වෙලබඩවත්ත හතරෙන් පංගුව" නමැති ඉඩමේ කොටසකින් බලයලත් මිනින්දෝරු එස්. ඒ. වී. පෙරේරා විසින් මැන අංක 51/84 හා 1984.05.11 දිනැති සැළැස්ම ප්‍රකාරව මැන බෙදා වෙන් කරන ලද කැබලි අංක A 2 දරන ඉඩම් කොටස වන උතුරු නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක A 1 දරන ඉඩම් කොටස සහ පී. ඊ. ද සේරම්ට අයිති ඉඩම ද, දකුණු නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක A 3 දරන ඉඩම් කොටස ද, දකුණු බස්නාහිරට : මෙම ඉඩමේ කැබලි අංක A 3 දරන ඉඩම් කොටස ද, උතුරු බස්නාහිරට : කොළඹ සිට නුවර දක්වා දිවෙන මහා මාර්ගය සහ මෙම ඉඩමේ කැබලි අංක A 1 දරන ඉඩම් කොටස ද, යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසි එකයි දශම පහයි බිංදුවක් (රූඩ්. 01, පර්චස් 21.50) හෙවත් හෙක්ටයාර් 0.15555 ක් විශාල ඉඩම සහ ඒ මත පිහිටි නිවස ගහකොළ පලතුරු ආදී සෑම සියලු දේ ද සමග වේ. (මෙම ඉඩම දැනට මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M/52/57 හි ලියාපදිංචි වී ඇත.)

රෙජිස්ට්‍රාර්,<br>
දිසා අධිකරණය,<br>
මහර.

වර්ෂ 2025 ක් වූ ජූලි මස 02 වැනි දින දී ය.

07-692

---

**මාරවිල දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි.

මහජන බැංකුව,<br>
ප්‍රධාන කාර්යාලය,<br>
අංක 75,<br>
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,<br>
කොළඹ 02.

නඩු අංකය : 391/MB<br>
ඇස්කිසි අංකය : 52/2024

............ *පැමිණිලිකරු.*

*එදිරිව*

සේනාධීරගේ ප්‍රියන්ති නිර්මලී,<br>
අංක 166, දෙවන පටුමග,<br>
සිරිගම්පල ජනපදය, ලුණුවිල.

ඉහත විත්තිකරුගේ ඇටර්නි බලකරු ලෙස,<br>
විල්ලප් ප්‍රැන්සිස්කුගේ රංජනී සෝවිස්,<br>
අංක 166, දෙවන පටුමග,<br>
උදාසිරිගම, ලුණුවිල.

............*විත්තිකරුවන්.*

මාරවිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ වර්ෂ 2023.05.17 වැනි දින ප්‍රකාශයට පත්කරන ලද ඒකපාර්ශ්වික තීන්දුව ප්‍රකාරව 391/MB දරන නඩුව සඳහා ඉහත නම් සඳහන් විත්තිකරුගෙන් පැමිණිලිකරුට 2019.11.15 දිනට අයවිය යුතු රු. 2,857,525.52 ක මුදල හා රු. 2,349,746.05 ක මුදල මත 2019.11.15 දින සිට 18.5% ක වාර්ෂික පොළී අනුපාතිකය මත සම්පූර්ණ මුදල ගෙවීම පැහැර හැර ඇති බැවින් එකී ඒකපාර්ශ්වික තීන්දුව ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ දැක්වෙන පරිදි විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයවිය යුතු 2019.11.15 දිනට රු. 2,857,525.52 ක මුදල සහ රු. 2,349,746.05 ක මුදල මත 2019.11.15 දින සිට 18.5% ක වාර්ෂික පොළී අනුපාතිකය මත සම්පූර්ණ මුදල ගෙවනු ලබන දින දක්වා පොලිය සහ වෙන්දේසි ගාස්තු අයකර ගැනීම සඳහා මෙම අධිකරණය මගින්

නිකුත් කර ඇති ඇස්කිසි ආඥාව ප්‍රකාරව පළමු වෙන්දේසියෙන් ලැබුණු රු. 1,262,500/- ක මුදල අඩු කර ඉතිරි මුදල සඳහා තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළෙහි එම විත්තිකරුට අයත් සියලුම හිමිකම් හා අයිතිවාසිකම්,

**වර්ෂ 2025ක් වූ අගෝස්තු මස 29 දින පෙ. ව. 11.30ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව සියල්ලන්ටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

***ඉඩමට පිවිසීම.***- වෙන්නප්පුව නගර මධ්‍යයේ සිට කොළඹ - පුත්තලම A3 මාර්ගයේ කි. මී. 1.5ක් දුරින් පිහිටි සුසේ පාර දක්වා ගමන් කර, එම පාරේ දකුණට හැරී මීටර් 600ක් පමණ ඉදිරියට ගොස් හමුවන ප්‍රජා ශාලාව පාරේ මීටර් 100ක් පමණ ගොස් නැවත දකුණට හැරී මීටර් 150ක් ගියවිට දකුණු පසින් සුරුකුම් දෙපල පිහිටා ඇත.

උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත්, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාව තුළ උතුරු කොලින්ජාඩිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත්, කොලින්ජාඩිය නැමති ගමේ පිහිටි, සියඹලාගහවත්ත, හික්ගහවත්ත, කජුගහවත්ත, මෝලවත්ත නමැති ඉඩමට, එස්. පී. රණසිංහ බලයලත් මානක තැන විසින් 2006.08.08 වැනි දින මැන සාදන ලද අංක 2602 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 67 දරන කොටසට මායිම්,

උතුරට : ඉහත පිඹුරේ ලොට් අංක 69 දරන 6.0 ක් පළල පාර ද,
නැගෙනහිරට : ඉහත පිඹුරේ ලොට් අංක 68 දරන වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට වෙන්කළ බිම ද,
දකුණට : පී. ජෙරාඩ් ප්‍රනාන්දු හා තවත් අයට අයිති ඉඩම ද,
බස්නාහිරට : ඉහත පිඹුරේ ලොට් අංක 49 දරන කොටස ද,

යන මෙකී මායිම් තුළ වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් බිංදුවයි දශම අටයි බිංදුව (රූඩ් 01, පර්. 0.80) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 108/259 හි ලියාපදිංචි වී ඇත.

ඉහත ඉඩම පහත පරිදි නැවත මැන සාදා ඇත.

ඉහත කී කොලින්ජාඩිය නමැති ගමේ පිහිටි, සියඹලාගහවත්ත, කජුගහවත්ත, හික්ගහවත්ත සහ මෝලවත්ත නමැති ඉඩමට, ඩබ්. එල්. එච්. ප්‍රනාන්දු බලයලත් මානක තැන විසින් 2012.03.20 වැනි දින මැන සාදන ලද අංක 10710 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන කොටසට මායිම්,

උතුරට : එස්. ජී. රණසිංහ බලයලත් මානක තැනගේ අංක 2602 දරන පිඹුරේ ලොට් අංක 69 දරන පාර ද,
නැගෙනහිරට : එස්. ජී. රණසිංහ බලයලත් මානක තැනගේ අංක 2602 දරන පිඹුරේ ලොට් අංක 68 කොටස ද,
දකුණට : පී. ජෙරාඩ් ප්‍රනාන්දු හා තවත් අයට අයිති ඉඩම ද,
බස්නාහිරට : එස්. ජී. රණසිංහ බලයලත් මානක තැනගේ අංක 2602 දරන පිඹුරේ ලොට් අංක 49 කොටස ද,

යන මෙකී මායිම් තුළ වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් බිංදුවයි දශම අටයි බින්දුව (රූඩ්. 01, පර්. 0.80) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

ඉහත ඉඩමට ප්‍රවේශ වීමට ඇති සියලුම පාරවල් ගමනාගමනය සඳහා පොදුවේ ප්‍රයෝජනයට ගැනීමේ අයිතිවාසිකම ද මේ සමග වේ.

ඉඩමේ ප්‍රමාණය : රූඩ් 01, පර්චස් 0.80

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
ගරු දිසා අධිකරණය, මාරවිල.

2025ක් වූ ජූනි මස 20 වැනි දින දී ය.

07 - 767

# විවිධ දැන්වීම්

## ස්වකීය සිවිල් සහ වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන (කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය

*නඩු අංකය* : CHC/28/2025/CO
*ස්වභාවය* : ගණන් බේරා වසා දැමීම

නුගේගොඩ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, නව රෝහල පාර, අංක 24, ප්ලාසා රෙසිඩන්සීස්, APT 513-2000 හි පිහිටි තිරසාර සුපර් මාකට් (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධ කාරණාවේ දී ය ;

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

(1) තම්බිලෙබ්බෙ මොහොමඩ් ඉම්තියාස්,
අංක 413/1, හැව්ලොක් පාර,
පාමංකඩ,
කොළඹ 05.

(2) තම්බිලෙබ්බෙ මොහොමඩ් නවාෂ්,
අංක 413/1, හැව්ලොක් පාර,
පාමංකඩ,
කොළඹ 05.

*දැනට :*

1-6-8, Nishiawaji,
Higashiyodogawa-ku,
Osaka, 533-0031,
Japan.

*ඔහුගේ ඇටර්නි බලකරුවන,*

තම්බිලෙබ්බෙ මොහොමඩ් ඉම්තියාස්,
අංක 413/1, හැව්ලොක් පාර,
පාමංකඩ,
කොළඹ 05.

(3) තම්බිලෙබ්බෙ මොහොමඩ් නව්සීන්,
අංක 413/1, හැව්ලොක් පාර,
පාමංකඩ,
කොළඹ 05.

*දැනට,*

3-190, Nagara-CHO,
Nakagawa-KU,
Nagoya, 454-0815
Japan.

*ඔහුගේ ඇටර්නි බලකරුවන,*

තම්බිලෙබ්බෙ මොහොමඩ් ඉම්තියාස්,
අංක 413/1, හැව්ලොක් පාර,
පාමංකඩ,
කොළඹ 05.

...............*පෙත්සම්කරුවන්.*

බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් පෙත්සම්කරුවන් විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් 2025ක් වූ මැයි මස 21 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්රුවන් වෙනුවෙන් නීතිඥ අනුරාධ සෙනරත් වේරගොඩ විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම සම්බන්ධයෙන් සමාගම වෙත නොතිසි නිකුත් කර වාර්තා 2025ක් වූ සැප්තැම්බර් මස 08 වැනි දිනට කැඳවීමට නියමකර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධවීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත්කාර්යය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි දී පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍යවන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයෙකු ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම්දෙනු ලැබේ.

අනුරාධ සෙනරත් වේරගොඩ,<br>
පෙත්සම්කරුවන්ගේ නීතිඥ,<br>
අංක 47/2/5, බෙල්මන්ට් වීදිය, කොළඹ 12.

*සටහන.-* එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ අනුරාධ සෙනරත් වේරගොඩ වෙත භාරදිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතුය. එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන් ම 2024ක් වූ සැප්තැම්බර් මස 07 වැනි දින සවස 6.00 ට පෙර ලැබෙන ලෙස භාරදිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතු ය.

07-689

---

**පාර්ලිමේන්තුව**

ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරුන්ගේ සහ තාක්ෂණවේදීන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පාර්ලිමේන්තු මන්ත්‍රී අසිත නිරෝෂන එගොඩවිතාන වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ "ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරුන්ගේ සහ තාක්ෂණවේදීන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී "ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරුන්ගේ සහ තාක්ෂණවේදීන්ගේ ආයතනය" සංස්ථාගත කිරීමයි :-

1. *(අ)* සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයින්ගේ සුභසාධනය හා වරප්‍රසාද ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම ;

2. *(ආ)* ගොඩනැගිලි සේවා ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණවේදය පිළිබඳ සිය දැනුම වර්ධනයකර ගැනීමට සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට පහසුකම් සලසා දීම ;

3. *(ඇ)* ගොඩනැගිලි සේවා ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණවේදය පිළිබඳ තොරතුරු හා අදහස් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතරේ හුවමාරුකර ගැනීම සඳහා පහසුකම් සැලැස්වීම,

යනාදිය වේ.

අසිත නිරෝෂන එගොඩවිතාන,<br>
පාර්ලිමේන්තු මන්ත්‍රී,<br>
කොළඹ දිස්ත්‍රික්කය.

07 - 715

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.